# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 14,727/9 — 1966 දෙසැම්බර් 29 වැනි බ්‍රහස්පතින්ද — 1966.12.29**

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය—සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

### මහජන බැංකුව

#### පැවරීමේ ආඥාව

(අංක 9)

1963 අංක 11 දරන මුදල් පනතේ 72 වැනි වගන්තියේ විධිවිධාන යටතේ මෙහි උපලේඛනයේ විස්තර කර ඇති දේපළ, එකී පනතේ VIII වැනි කොටසේ කාර්යයන් සඳහා අත්පත් කර ගතයුතු යයි මහජන බැංකුව නිශ්චය කර ඇති හෙයින් ද, ඒ නිශ්චය කිරීම මුදල් ඇමතිවරයා වෙත දනුම් දෙනු ලැබීමට එකී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපති විසින් කටයුතු සලස්වා ඇති හෙයින් ද එකී දේපල මහජන බැංකුව කෙරෙහි පැවරීමට එකී පනතේ 72 (2) වැනි වගන්තිය ප්‍රකාර, මුදල් ඇමතිවරයාට බලය ලැබී ඇති හෙයින් ද,

මෙහි උපලේඛනයෙහි විස්තර කොට ඇති දේපල එක්දහස් නවසිය හැටහයක් වූ දෙසැම්බර් මස 27 වැනි දින සිට මහජන බැංකුව කෙරෙහි පවරමින් මුදල් ඇමති, උක්කු බණ්ඩා වන්නිනායක වන මම මෙසින් අණ කරමි.

යූ. බී. වන්නිනායක,
මුදල් ඇමති.

1966 දෙසැම්බර් මස 27 වැනිදා,
කොළඹ දීය.

### උපලේඛනය

(1) බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ හාපිටිගම් කෝරළයේ යටිගහ පත්තුවේ වැලිහිඳ පිහිටි සියඹලාගහවත්ත නැමැති ඉඩමේ බෙදා වෙන් කළ "සී" අක්ෂරය දරන කැබැල්ලට ඩබ්ලිව්. ඩී. ජේම්ස් අවසරලත් මිනින්දෝරු මහතාගේ අංක 1,634 සහ 1965.8.27 දින දරන පිඹුර අනුව උතුරට: මෙම ඉඩමේ "බී" අක්ෂරය දරන කැබැල්ලද; නැගෙනහිරට: පාර ද; දකුණට: කේ. ෆ්‍රැන්සිනා ප්‍රනාන්දුගේ උරුමක්කාරයින් ගේ දේපළ ද; බස්නාහිරට: තෝමිස් අප්පු ගේ ඉඩම සහ එල්. ස්කොලොස්ටිකා ප්‍රනාන්දු ගේ උරුමක්කාරයින්ගේ දේපළ ද; යන මායිම් තුළ අක්කර දෙකක් (අ. 2, රූ. 0, ප. 0) විශාල ඉඩම ද එහි ඇති වැව්ලි ගොඩනැගිලි ආදී සියලු දෑයද වේ.

(ගොනු අංකය: 1001/1/256)

(2) බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ සල්පිටි කෝරළයේ පල්ලේ පත්තුවේ මොරටු පළාත් ආණ්ඩු සභා සීමාව තුළ උයන ගමේ උයන පාරේ වරිපනම් අංක 133/5 දරන මෝදරපොල දොඹගහ වත්ත නැමැති ඉඩමේ බෙදා වෙන් කළ ඒ 1 දරන කොටසට ඩබ්ලිව්. ඒ. එල්. ද සිල්වා අවසරලත් මිනින්දෝරු තැන ගේ අංක 1,999 සහ 1953.8.19 දින දරන පිඹුර අනුව උතුරට: පී. එස්. රුද්‍රිගුට අයත් දේපළ ද; නැගෙනහිරට: මෙම ඉඩමේ "බී" අක්ෂරය දරන කැබැල්ල ද; දකුණට: මෙම ඉඩමේ ඒ 2 දරන ඉඩම් කැබැල්ල ද; බස්නාහිරට: දුම්රිය මාර්ගයට වෙන් වූ බිම ද; යන මායිම් තුළ පර්චස් දහතුනක් (අ. 0, රූ. 0, ප. 13 ක්) විශාල ඉඩම ද එහි ඇති වැව්ලි, ගොඩනැගිලි ආදිය සියලු දෑය ද වේ.

(ගොනු අංකය: 1116/1/290)

(3) බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ දකුණු අළුත්කුරු කෝරළයේ රාගම් පත්තුවේ මීගමුවේ ඉඩම් ලියාපදිංචි කිරීමේ කොට්ඨාශයේ පමුණුගම පිහිටි අට්ටික්කාගහවත්තේ කොටස නැමැති අක්කර භාගයක් පමණ විශාල ඉඩමේ නොබෙදූ දෙසෙන් පංගුවට උතුරට: මරියානු අන්නාවිරාළට සහ රපියෙල් අප්පුහාමිට අයත් ඉඩමේ පැල ඉනි වැට ද; නැගෙනහිරට: දොන් කයිතාන් අප්පුහාමිගේ සහ දෝන සලෝමියා හාමිගේ ඉඩම ද; දකුණට: මනිවෙල් පෙරේරා අප්පුහාමිට හා තවත් අයට අයත් ඉඩම් ද; බස්නාහිරට: මරියානු අන්නාවිරාළට සහ රපියෙල් අප්පුහාමිට අයත් වත්ත ද සඳහන් වෙතත්, එම්. ඩී. ජේ. වී. පෙරේරා අවසරලත් මිනින්දෝරු තැනගේ අංක 148 සහ 1964.7.2 දින දරන සැලැස්ම අනුව උතුරට: ජුසේ අප්පුහාමිට අයත් ඉඩම සහ ඇලන් මරියා හා අන් අයට අයත් දේපළ ද; නැගෙනහිරට: ඇලන් මරියා හා අන් අයට අයත් දේපළ ද; දකුණට: ජී. කැමිලස් පෙරේරාට අයත් ඉඩම ද; බස්නාහිරට: කේ. ඩී. ඇන්තනීට අයත් ඉඩම හා පී. ඩී. එංගල්තිනාහාමිට අයත් ඉඩම ද; යන මායිම් තුළ පර්චස් විස්සයි දශම හතරක් (අ. 0, රූ. 0, ප. 20.4 ක්) විශාල ඉඩම ද එහි ඇති වැව්ලි, ගොඩනැගිලි ආදී සියලු දෑය ද වේ.

(ගොනු අංකය: 735/1/177)

(4) බස්නාහිර පළාතේ මීගමු දිස්ත්‍රික්කයේ අළුත්කුරු කෝරළයේ දූනගහ පත්තුවේ ඔබ්බේරියේ පිහිටි තල්ගහවත්ත නැමැති ඉඩමේ බෙදූ දකුණු කැබැල්ලෙන් නැගෙනහිර පැත්තේ බෙදූ 1/4 පංගුවට උතුරට: දොන් මිගෙල් අප්පුහාමිට අයත් ඉඩම ද; නැගෙනහිරට, දකුණට හා බස්නාහිරට: දොන් අගොස්තීනු මදූරාවිලට අයිති ඉඩම ද; යන මායිම් තුළ රූඩ් එකහමාරක් විශාල යයි සඳහන් වෙතත්, ඩබ්ලිව්. ඩී. ජේම්ස් අවසරලත් මිනින්දෝරු තැනගේ අංක 1,585 සහ 1965.6.16 දින දරන සැලැස්ම අනුව බෙදා වෙන් කළ "ඒ" සහ "බී" (පාරක් සඳහා වෙන් කළ බිම) දරන කොටස්වලට උතුරට: ඔගස්ටින් මදූරාවලගේ උරුමක්කාරයින්ගේ ඉඩම ද; නැගෙනහිරට: ඒ. එම්. මදූරාවලට අයත්ව තිබී, දැනට එම්. ඩී. සන්තියාගු අප්පුහාමිට සහ සී. රුද්‍රිගු මනුවෙල්පුල්ලේට අයත් දේපළ ද; දකුණට: ඒ. මදූරාවලගේ උරුමක්කාරයන්ට අයත් දේපළ ද; බස්නාහිරට: ඒ. මදූරාවලගේ උරුමක්කාරයින්ට අයත් දේපළ ද; යන මායිම් තුළ රූඩ් එකයි, පර්චස් දහතුනයි දශම හතක් (අ. 0, රූ. 1, ප. 13.7 ක්) විශාල ඉඩම ද, එහි තුළ පිහිටි වැව්ලි, ගොඩනැගිලි ආදී සියළු දෑයද වේ.

(ගොනු අංකය: 748/1/178)

(5) බස්නාහිර පළාතේ මීගමුව දිස්ත්‍රික්කයේ අළුත්කුරු කෝරළයේ දූනගහ පත්තුවේ කටියල ගමේ පිහිටි මීගහවත්ත නැමැති අක්කර භාගයක් පමණ විශාල ඉඩමට උතුරට: මූලින් පැවරුම්කරුට අයත්ව තිබූ දේපල ද; නැගෙනහිරට: පැවරුම් ලබන්නාට අයත් අලදන්ගහ වෙල කුඹුර ද; දකුණට: පී. මනුවෙල් ප්‍රනාන්දුට අයත් ඉඩම ද; බස්නාහිරට: වෝල්ටර් බෙන්ජමින් ද සිල්වා රාජපක්ෂට අයත් ඉඩම ද; යයි සඳහන් වෙතත්, ඩබ්ලිව්. ආර්. එස්. ප්‍රනාන්දු අවසරලත් මිනින්දෝරු තැන ගේ අංක 8,528 හා 1965.7.8 දින දරන සැලැස්ම අනුව උතුරට: කේ. සිරිසේන සොයිසා හා කේ. මසිලින් සොයිසාට අයත් ඉඩම් හා වයි. ලිවිනිස් සිල්වාට අයත් කුඹුරද; නැගෙනහිරට: එස්. විලියම් ප්‍රනාන්දුට අයත් කුඹුර ද; දකුණට:

1052/31——එච 165—11,175 (66/12)

අවසරලත් මිනින්දෝරු තැන විසින් 1904.9.29 දින පිළියෙල කරන ලද සැලැස්මේ "ඒ" අක්ෂරය දරණ ඉඩම් කැබල්ලට උතුරට: රාමූගේ බිරිඳ වූ මුත්තුපිල්ලේගේ හා කොටස්කරුවන්ගේ දේපලද; නැගෙනහිරට: "බී" අක්ෂරය දරණ ඉඩම් කැබැල්ල සහ රාමූගේ බිරිඳ වූ මුත්තුපිල්ලේගේත් කොටස්කරුවන්ගේත් දේපල ද; දකුණට: පාර ද; බස්නාහිරට: අඩිපාර ද යන මායිම් තුළ ලාචම් දහ අටයි වීසිකුලී එකක් (ලා. 18, වීසිකු. 1ක්) විශාල ඉඩම ද එහි ඇති වැවිලි ගොඩනැගිලි ආදී සියලු දැයද වේ.

(ii) ඉහත කී පෙරියපලෙයි ගමේ පිහිටි තච්චන් පුලමුම් පුල්ලාන්දි කාඩුම් නැමැති ඉඩමට ආර්. බී. සිවගුරු නොතාරිස් තැන විසින් 1962.7.16 දින සහතික කරන ලද අංක 2699 දරණ ඔප්පුව අනුව උතුරට: සිදම්බරම්පිල්ලේ මුත්තුවේලුගේ දේපලද; නැගෙනහිරට: සවරි මුත්තු මනුවැල් පිල්ලේගේ දේපල ද; දකුණට: පාර ද; බස්නාහිරට: අංක බී 27/259 දරණ පත්ඉරුවේ සඳහන් ඉඩමද, යන මායිම් තුළ යයි සඳහන් වෙතත්, යාපනේ දිස්ත්‍රික් උසාවියේ අංක 3655 දරණ බෙදුම් නඩුවේ යාකර ඇති සී. තම්බයියා අවසරලත් මිනින්දෝරු තැන විසින් 1904.9.29 දින පිළියෙල කරන ලද සැලැස්මේ බී අක්ෂරය දරණ ඉඩම් කැබල්ලට උතුරට: රාමූගේ බිරිඳ වූ මුත්තුපිල්ලේගේ හා කොටස්කරුවන්ගේ දේපලද; නැගෙනහිරට: සී අක්ෂරය දරණ කැබැල්ල ද; දකුණට: පාර ද; බස්නාහිරට: ඒ අක්ෂරය දරණ ඉඩම් කැබැල්ල ද යන මායිම් තුළ ලාචම් නවයයි, වීසිකුලී භාගයක් (ලා. 9 වීසිකු. 1/2ක්) විශාල ඉඩම ද එහි ඇති වැවිලි ගොඩනැගිලි ආදී සියලු දැය ද වේ.

(ගොනු අංකය: 1080/9/147)

(24) උතුරු පළාතේ යාපනේ දිස්ත්‍රික්කයේ වඩමරාච්චි කොට්ඨාශයේ පේද්දුරුතුඩුව ප්‍රදේශයේ පේද්දුරුතුඩුව මලවරායකුරිච්චි ගමේ පිහිටි මාවයිඩ්ඩයි නැමැති ඉඩමට ඒ. එන්. වේලායුදන් නොතාරිස් තැන විසින් 1962.6.8 දින සහතික කරන ලද අංක 1613 දරණ ඔප්පුව අනුව, උතුරට: මානික්කම්ගේ බිරිඳවූ අන්නාපිල්ලේගේ දේපලද; නැගෙනහිරට: නාගලිංගම් පුදතම්බිගේ දේපලද; දකුණට: මුරුගු පිල්ලේ ගේ බිරිඳවූ වල්ලිපිල්ලේගේ උරුමක්කාරයන්ගේ දේපල සහ තම්බයියාගේ බිරිඳවූ වෙල්ලම්මාගේ උරුමක්කාරයන්ගේ දේපලද, පදුමගද; බස්නාහිරට: නාගමුත්තුගේ බිරිඳවූ කමලම්ගේ හා අතිකුත් අයගේ දේපලද, යන මායිම් තුල ලාචම් දෙකක් පමණ විශාල යයි සඳහන් කොට ඇතත්, එස්. සුබ්‍රමනියම් අවසරලත් මිනින්දෝරු මහතාගේ අංක 1173 සහ 1964.9.28 දින දරණ පිඹුර අනුව, උතුරට: මානික්කම්ගේ බිරිඳවූ අන්නාපිල්ලේගේ දේපලද; නැගෙනහිරට: නාගලිංගම් පුදතම්බිගේ දේපලද; දකුණට: පදුමග ද; බස්නාහිරට: නාගමුත්තුගේ බිරිඳවූ කමලම්ගේ හා අතිකුත් අයගේ දේපලද, යන මායිම් තුල ලාචම් දෙකයි වීසිකුලී තුනයි තිස් දෙකෙන් අටක් (ලා. 2 වීසිකු. 3 8/32ක්) විශාල ඉඩමද එහි ඇති වැවිලි ගොඩනැගිලි ආදී සියලු දැයද වේ.

(ගොනු අංකය: 1125/9/158)

(25) වයඹ පලාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ තිරගන්දහේ කෝරළේ වැළඩවිල්ලි හත්පත්තුවේ කුරුණෑගල පළාත් ආණ්ඩු සභා සීමාව තුළ පිහිටි මාලිගාවත්ත සහ මාලිගාවත්තේ වෙල නැමැති ඉඩමේ බෙදා වෙන් කරන ලද අංක 16 දරණ ඉඩම් කැබැල්ලට වී. ඒ. එල්. සේනාරත්න අවසරලත් මිනින්දෝරු තැන විසින් මැන සාදන ලද අංක 335 සහ 1952.3.23 දින දරණ පිඹුර අනුව මායිම්, උතුරට: මෙම ඉඩමේ අංක 17 දරණ ඉඩම් කැබැල්ලද; නැගෙනහිරට: පාරක් සඳහා වෙන් කරන ලද අංක 25 දරණ ඉඩම් කැබැල්ලද; දකුණට: මෙම ඉඩමේ අංක 15 දරණ ඉඩම් කැබැල්ලද; බස්නාහිරට: දිය අගලද, යන මායිම් තුළ පර්චස් තිස්පහක් (අ. 0, රූ. 0, ප. 35ක්) විශාල ඉඩමද එහි පිහිටි වැවිලි ගොඩනැගිලි සහ සියලු දැයද වේ.

(ගොනු අංකය: 771/12/65)

(26) දකුණු පලාතේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ නැගෙනහිර ගිරුවාපත්තුවේ උඩකනුකැටියේ ඉහලගම පිහිටි උඩමුළුපොත හෙවත් පාළුගහකුඹුර නැමැති ඉඩම් කොටසට, උතුරට: රොටවලද; නැගෙනහිරට: කච්චිගල් ආරද; දකුණට: පහලමුළුපොතද; බස්නාහිරට: දෙනියේ බතුමුනුපැලියද, යන මායිම් තුළ අක්කර හතරයි, රූඩ් තුනයි, පර්චස් තිස් තුනක් විශාල ඉඩමේ නොබෙදූ දෙකෙන් එක් කොටසක් ලෙස දැක්වුවද, ජී. අමරසේන විජයතිලක අවසරලත් මිනින්දෝරු තැනගේ අංක 835 සහ 1964.7.17 දින දරණ පිඹුර අනුව බෙදා වෙන් කළ ඒ අක්ෂරය දරණ කොටසට, උතුරට: මෙම ඉඩමේ "බී" අක්ෂරය දරණ කොටසද; නැගෙනහිරට: කච්චිගල් ආරද; දකුණට: මෙම ඉඩමේ කොටසක් වන පහලමුළුපොතද; බස්නාහිරට: දෙනිය බතුමුනුපැලියද, යන මායිම් තුළ අක්කර එකයි, රූඩ් තුනයි, පර්චස් විසි එකක් (අ. 1, රූ. 3, ප. 21ක්) විශාල කුඹුරු ඉඩමද එහි ඇති වැවිලි ගොඩනැගිලි ආදී සියලු දැයද වේ.

(ගොනු අංකය: 180/8/4)

12-1467

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රිතයි